“කොවිඩ් 19 අභියෝග හමුවේ නොසැලෙන තර්ස්ටන් අපි”

# ක්‍රියාකාරකම් අත්වැල

# 8 ශ්‍රේණිය - සිංහල

තර්ස්ටන් විද්‍යාලය

කොළඹ 07

Type your text

<u>**8 ශ්‍රේණිය**</u>

<u>**සිංහල භාෂාව හා සාහිත්‍යය**</u>

## 1 ක්‍රියා පද



1.අණ කිරීමක්,ඉල්ලීමක්,නියම කිරීමක් හැඟවෙන ක්‍රියා පද ............................................... නම් වේ.

අවුරුදු

2.යහපත හෝ අයහපත පිණිස කරන ප්‍රාර්ථනාවක් ...................................................... ක්‍රියා නමින් හැඳින්වේ.

පහත ක්‍රියා පද නම් කරන්න.

1.බුදු පහන දල්වන්න. -

2.සුවහසක් මල් පිපේවා. -

3.දැන් නික්ම යනු මැනවි. -

4.මා කියන දේ කවුරුත් අසත්වා. -

5.වනයේ වුණත් රැකවරණය ඇති වේවා. –

• පහත ක්‍රියා පද ඔබට නියමිත ක්‍රියා පද වර්ගවලට අනුව සකසන්න.

උදා - දුවන්න - දුවනු/දුවනු මැනවි

1.පනිමින් - ..........................................................................................

2.ගයා - ..........................................................................................

3.නටති - ..........................................................................................

4.පවසමි - ..........................................................................................

5.දෙන්න - ..........................................................................................

6.ලැබෙයි - ..........................................................................................

7.දැනෙයි - ..........................................................................................

8.ඇසෙයි - ..............................................................................

9.සදමි - .......................................................................

10.පිළිගනියි - ..........................................................................................

## 2 රබීන්ද්‍රනාත් තාගෝර්




1.රබීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ ජන්ම විස්තර ලියන්න.

2. රබීන්ද්‍රනාත් තාගෝර් නම් වූ ශ්‍රේෂ්ඨ කවියා හැඳින්වූ වෙනත් නම් මොනවාද?

3.තාගෝර්තුමාගේ කෘති පිළිබඳව විස්තර සහිත ලේඛනයක් පහත අංශ යටතේ ඉදිරිපත් කරන්න.

- නාට්‍ය
- කාව්‍ය
- ශාස්ත්‍රීය හා විචාර
- භක්ති ගීත

4.තාගෝර්තුමාගේ දැඩි දේශාමාමකත්වය පිළිබිඹු වන නිර්මාණ මොනවා ද?

5.තාගෝර්ගේ රන් පොතට ලිපි සැපයූ අය කවුරුන් ද?

6. තාගෝර්තුමාගේ පිංතූරයක් හා ඔහුගේ කෘතියක කවරය සහිත පිංතූරයක් අලවන්න.

## 3 අල්පප්‍රාණ හා මහප්‍රාණ අකුරු භාවිතය



1.පහත ඇති අල්පප්‍රාණ අක්ෂර හා මහාප්‍රාණ අක්ෂර වෙන වෙන ම වගුගත කරන්න.

ක, ච, ඵ ,ප , ඝ , ඨ , ත , හ , ට , ඛ , ධ , ථ , ග

2.මහාප්‍රාණ ශබ්ද උපදින්නේ කෙසේ ද?

3.අල්පප්‍රාණ ශබ්ද  උපදින්නේ කෙසේ ද?

4.රබීන්ද්‍රනාත් තාගෝර් පාඩමේ ඇති අල්පප්‍රාණ හා මහාප්‍රාණ අකුරු සහිත වචන පහළව බැගින් වගුගත කරන්න.

**නාම පද හා බහුවර්ථ පද**



- නාම පද වර්ග නම් කරමු
  1.
  2.
  3.
  4.
  5.

- නාම පද යනු ........................................................................................      යි.

1.ජාති නාම,ද්‍රව්‍ය නාම,ගුණ නාම,ක්‍රියා නාම ඇතුළත් වගුවක් සකස් කරන්න.එක නාම වර්ගයකට උදාහරණ පහ බැගින්වත් තිබිය යුතු ය.

පහත තද්ධිත ප්‍රත්‍ය යොදා තද්ධිත නාම දෙක බැගින් සාදමු.

1.වත් -

2.මත් -

3.ඉක -

4.තම -

5.මුවා -

6 . ඊය -

7. නු -

8 . ආණ -

9 . තා -

10. ත්ව -

කෘදන්ත නාම ලියමු.

1.නට + උම් -

2.ගය + ර්ම් -

3.සඳ + ඉලි -

4.කප + න -

5.ලිය+ මන් -

පහත පදවලින් කියවෙන බහුවර්ථ තුන බැගින් ලියන්න.

1.අකුරු -

2.තුරු -

3.කර -

4.සඳ -

5.පිය -

6.නා -

7.දිය -

8.සත් -

9.සක් -

10.පා -

තවත් බහුවර්ථ පද

මහ - මාසය , විශාල

ඉසුරු - ඊශ්වර, අධිපති , සම්පත්

වග - ව්‍යාඝ්‍ර , වර්ග , බව

උතුරු - උත්තර , උත්තම , උතුරු දිශාව

දද - කොඩි , කුෂ්ඨ , කුරුලු , මෝඩ , බමුණු

වත - මුහුණ , විස්තරය , වස්ත්‍ර , ව්‍රතය

## 3 පාඩම - අලුත් අවුරුදු උත්සවය



1.අවුරුද්ද යන වදනින් පවා ජනිත වන්නේ කුමක් ද?

2. අපේ අනන්‍යතාව ප්‍රදර්ශනය කෙරෙන මහඟු ජාතික උත්සවයක් ලෙස හැඳින්වෙන්නේ කුමක් ද?

3. අලුත් අවුරුදු උත්සවය ළං වී ඇති බව හඟවන පරිසර සාධක මොනවා ද?

4. අලුත් අවුරුදු උත්සවය පිළිබඳ සිතුවමක් අඳින්න.

5. නැකැත් වේලාවට අනුව සිදුකරන චාරිත්‍ර කටයුතු මොනවා දැයි පිළිවෙළින් නම් කරන්න.

6. නොනගතය යනු කුමක්ද? නොනගතයට අප කරන දෑ සිතුවමට නගන්න.

7.පිරිසිදු බව හා නැවුම් බව ප්‍රකට වන අවුරුදු චාරිත්‍ර කිහිපයක් නම් කරන්න.

8. වෙනත් සංස්කෘතිවලින් ශ්‍රී ලංකාවේ අවුරුදු සිරිත් අතරට එක් වූ අංග ලියන්න.

9. බුලත් දී වැඳීමේ අවුරුදු චාරිත්‍රයේ ඇති අගය කුමක් ද?

10. සුන්දර අවුරුදු කෑම මේසයක් අඳින්න.

11.අලුත් අවුරුදු සිරිත්වල සමාන අසමානතා සංසන්දනය කරමින් සිංහල හා හින්දු ජාතිකයන් සමරන අලුත් අවුරුද්ද පිළිබඳ  වගුවක් සකසන්න.

12. ඔබේ ප්‍රදේශයට විශේෂ වූ සහ පාඩමේ සඳහන් සිරිත්වලට වඩා වෙනස් ලෙස සිදු කෙරෙන අවුරුදු සිරිත් විරිත් පිළිබඳව විස්තර එක්රැස් කර බිත්ති පුවත්පත් ලිපියක්   ලියන්න.

13. අවුරුදු ක්‍රීඩා කිරීමේ අර්ථය ලෙස ඔබ දකින්නේ කුමක් ද?

14. අවුරුදු කාලයේ දී ගායනා කරන ඔන්චිලි වාරම් කවි දෙකක් ලියන්න.

## 3 පාඩම - අක්ෂර වින්‍යාස රීති



1.ගණන් කිරීම,ගණිනවා වැනි අදහස සහිත ව ගොඩ නැගී ඇති සියලුම නාම පදවල මුර්ධජ ‘ණ’කාරය යෙදී ඇති බැවින් එවැනි වදන් දහයක් ලියන්න.

2.කරණය යන වචන බණ්ඩය යෙදෙන පද රාශියක් භාවිත වේ.එවැනි පද දහයක් ලියන්න.

3.මූර්ධජ 'ෂ' යන්නට පසුව එන 'ණ'යන්න මූර්ධජ වේ.එවැනි පද දහයක් ලියන්න.

4.'ර' යන්නට පසු මූර්ධජ 'ණ'කාරය යෙදෙන නාම පද දහයක් ලියන්න.

5.රකාරාංශය සහිත අකුරකට පසුව මූර්ධජ 'ණ'කාරය යෙදෙන වචන දෙකක් ලියන්න.

6.ගැටය සහිත ඇලපිල්ලට පසුව මූර්ධජ 'ණ'කාරය යෙදෙන වචන දෙකක් ලියන්න.

7.ගෞරවාර්ථය හැඟවීමට යෙදෙන පදවල මූර්ධජ 'ණ'කාරය යෙදෙන බවට උදාහරණ දෙකක් ලියන්න.

8.මූර්ධජ 'ණ' යෙදෙන අතීත කාල ක්‍රියා පද තුනක් ලියන්න.

9.පදයක අවසානයේ දී හල් වී යෙදෙන්නේ මින් කුමක් ද?
මූර්ධජ 'ණ' , දන්තජ 'න'

10.ක්‍රියා පදවල 'ර'කාරයට පසුව දන්තජ 'න' යෙදෙන අවස්ථාවලට උදාහරණ දෙකක් ලියන්න.

## 4 පාඩම - ශබ්ද කෝෂ භාවිතය



1.ශබ්ද කෝෂ යනු කුමක් ද?

2.භාෂාන්තර ශබ්ද කෝෂ යනු කුමක් ද?

3.ඔබ දන්නා ශබ්ද කෝෂ තුනක නම් ලියන්න.

4.සිංහලයේ යෙදුණු වචනයක අරුත දැන ගැනීමට අපට උපකාරී වන ප්‍රධානතම ශබ්ද කෝෂය කුමක්ද?

5.තෝරාගත් විෂය ක්ෂේත්‍රයකට අයත් වචන සංග්‍රහ කෙරෙන ශබ්දකෝෂ මොනවාද?

6.ශබ්දකෝෂ පරිශීලනයෙන් ලද හැකි ප්‍රයෝජන මොනවාද?

7.දැනට සිංහල ලේඛන ව්‍යවහාරයේ ඇති හෝඩිය අකාරාදි පිළිවෙළට මතකයෙන් ලියන්න.

8.සුචිය වැදගත් වන්නේ ඇයි?

9.ශබ්දකෝෂයක් ආශ්‍රයන් 'ඔ' සහ 'ළ' අකුරුවලින් ආරම්භ වන වචන පහක් බැගින් ගෙන ඒවායේ අර්ථය දක්වන්න.

10.ඔබ හදාරන සෞන්දර්ය විෂයට අදාළ වචන පණහක් පමණ එක්රැස් කොට කුඩා ශබ්දකෝෂයක් පිළියෙල කරන්න.

11.කිරිකඩ හේලය ශබ්දකෝෂයේ අර්ථ දක්වා ඇත්තේ කෙසේද?

12.කිරිකෝඩු යන්න හඳුන්වන්න.

13.පන්තිකාමරය පිරිසිදු කිරීමේ නාමලේඛනය අකාරාදි පිළිවෙළට සකස් කරන්න.

## 6 පාඩම - කතා බහට අවධානය



පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

1.නිවේදනයකට හෝ පණිවිඩයකට ප්‍රතිචාර දැක්වීමේ දී වඩාත් වැදගත් වන්නේ මොනවා ද?

2.කතාබහේ දී හා සංවාදවලදී අත්‍යවශ්‍ය ගුණාංග තුනක් ලියන්න.

3.පෙත්සම නවකතාව ලිව්වේ කවුද?

4.පුද්ගල විවිධත්වය අනුව ආමන්ත්‍රණය හා කතාබහ වෙනස් වන අවස්ථාවලට උදාහරණ තුනක් ලියන්න.

5. පහත ප්‍රකාශ කවුරුන් විසින් කාහට කරන ලද දැයි ලියන්න.

- මොනවාද විදානෙගේ වැරදි ?
- එදාට විශේෂ රාජකාරියක් යෙදී නැහැ.
- බැරි ද ඉංග්‍රීසියෙන් ම කියන්න.
- අපිට වෙලා තියෙන්නේ හරිම කරදරයක්.

6. ඔබේ පාසලේ අධ්‍යාපන චාරිකාවක් සඳහා බස් රථයක් ලබා ගැනීම සඳහා ව්‍යාපාරික මහතකු සමඟ කරන කතාබහ අළලා සංවාදයක් ගොඩනගන්න.

7. ඔබ ඉගෙන ගන්නා දහම් පාසලේ ස්වාමීන් වහන්සේ නමක/පූජකවරයෙකු සමඟ කෙරෙන දෙබසක් ගොඩ නගන්න.

## 8 - ප්‍රායෝගික ලේඛන



1.ප්‍රායෝගික ලේඛන යනු මොනවාද?

2.ඔබ 6 සහ 7  ශ්‍රේණිවල දී ඉගෙන ගත්  ප්‍රායෝගික ලේඛන වර්ග මොනවා ද?

3.නිරවුල් සන්නිවේදනයක් සඳහා දැන්වීම් පත්‍රිකා ප්‍රයෝජනවත් වේ.එහි ගැබ් විය යුතු අනිවාර්ය ලක්ෂණ මොනවා ද?

4.ඔබ පාසලෙන් සංවිධාන කරන දීපව්‍යාප්ත රචනා තරගයක් පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් පුවත්පතක පළ කිරීමට සුදුසු දැන්වීමක් නිර්මාණය කරන්න.

5.ආකෘති පත්‍ර යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.

6.ආකෘති පත්‍ර අවශ්‍ය වන අවස්ථා මොනවාද?

7. ආකෘති පත්‍රයක අත්සන යෙදීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු කුමක් ද?

8.ඔබ පාසලේ පුස්තකාලයට සාමාජිකයන් බඳවා ගැනීම සඳහා සුදුසු ආකෘති පත්‍රයක් පිළියෙල කරන්න.

## 9 - අවුරුදු සිහිනය



1.කෙටිකතාවක් යනු කුමක් ද?

2.කෙටිකතාවක තිබිය යුතු ලක්ෂණ මොනවාද?

3.අවුරුදු සිහිනය කෙටිකතාව ලියූ ප්‍රකට ලේඛකයා කවුද?

4.ඔහු විසින් ලියූ වෙනත් නිර්මාණ මොනවාද?

5.අවුරුදු සිහිනය කෙටිකතාව කුමන කෙටිනකා සංග්‍රහයෙන් උපුටා ගන්නා ලද්දක් ද?

6.කෙටිකතාව කියවීමෙන් ඔබ ලද රසය කෙටියෙන් විස්තර කරන්න.

7.කෙටිකතාවක  කතාපුවත ගොඩනැගීම  පිළිබඳව ඔබ ඉගෙන ගත් කරුණු මොනවා ද?

8.දක්ෂ කෙටිකතාකරුවාගේ කාර්යයන් මොනවා ද?

9.නවකතා හා කෙටිකතාවක වෙනස දක්වන්න.

10.ඔබ කියවා ඇති වෙනත් කෙටිකතා දෙකක නම් ලියන්න.

11.මේ කෙටිකතාවෙහි ඇතුළත් සිතෙහි මැවෙන අවස්ථාවක් චිත්‍රයට නගන්න.

12.මෙම කෙටිකතාවේ අවසානය ඔබ කැමති ආකාරයට නිර්මාණය කර , කතාව ඉදිරියට ගොඩ නගන්න.

13.මේ සිදුවීම් පිළිවෙළට සකස් කරන්න.

- පියසේන රතිඤ්ඤා පෙට්ටි දෙස බලා සිටින විට අම්මා පිටමන් වී යන්නට ඇතැයි සිතුණි.
- ඔහු කී වචන ඇසූ පියසේන තුළ ලැජ්ජාවක ද කනගාටුවක් ද ඇති විය.
- ඔහු මුදලත් රැගෙන පිටමන් විය.
- ඔහු වහා කාමරයට ගියේ ය.
- පියසේන ඉකිබිඳින හඬ ද ඇසුණි.ඔහු බියෙන් ගැහෙන හදවතින් යුතුව පාර දෙස බැලී ය.

14.පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කාහට කුමන අවස්ථාවක කියන ලද දැයි ලියන්න.

- යන්න පුතා,මං උඹ අවුරුද්දට එක්ක එන්න එනවා.

- අනේ බලාගන්න හොඳ හැටි

- ඉඳා ඉක්මන්ට කඩේට ගිහිල්ලා නූල් රෝද දෙකක් අරගෙන වරෙන්.

- එහෙනම් ඒක ගන්න හැදුවේ . පලයන් යන්න.

- උඹ ළඟ සල්ලි තිබෙනවා ද?

- අනේ අම්මේ කොහොම හරි එන්න. මං එනකං ඔන්චිල්ලාව බඳින්න එපා.

- ඔව් දන්නවා. ඉතින් මොකක්ද ඕනෑ?

- අපේ අම්මාට මොකවත් උනොතින් දන්නනව ද ?

## 10 සැබෑ ළෙන්ගතුකම



පහත ඡේදයේ හිස්තැන් පුරවමු.

.................................................................. ඩෙන්මාර්ක් ජාතික සුරංගනා කතාකරුවෙකි.ඔහු ලියූ ..................................................................නමැති කතාව සින්දු කියන කිරිල්ලියක වටා ගෙතී ඇත. ........................................................................................... ආදිය ඔහුගේ සෙසු ළමා කතා ඉතා ජනප්‍රිය ඒවා ය.සැබෑ ළෙන්ගතුකමක් ඇති වන්නේ............................................................. කිරිල්ලිය හා .......................................................... අතර ය.

පහත ප්‍රකාශන කවුරුන් විසින් කාහට කියන ලද දැයි ලියන්න.

- මගේ ගායනය වඩා මිහිරි වන්නේ මේ සුන්දර හරිත වනය තුළ යි.
- ඒත් ඔබ මාව පිටමං කළේ නෑ.
- එහි තොරතුරු අසත්‍ය විය නොහැකි යි.
- මට එය අමතක නැහැ.
- ඔබ අපට ඇය සිටින තැනක් පෙන්වන්න.
- මට මේ වන තුරු ඒ වගක් නො කිව්වේ ඇයි?
- මම දන්නවා ඒ ලස්සන සිංදු කියන කිරිල්ලිය ඉන්න තැන.

කෙටි පිළිතුරු ලියන්න.

1.රසවත්ව ගොතා ලියන කතන්දර හඳුන්වන්නේ කුමන නමකින් ද?

2.එවැනි කතාකරුවන් ඒවා රසවත් කිරීමට යොදන උපක්‍රම මොනවා ද?

3.සැබෑ ලෙන්ගතුකම කතාවෙන් ඔබ ලද ජීවිතාදර්ශ මොනවා ද?

4.;ඔබ කියවා ඇති වෙනත් සුරංගනා කතා කීපයක් නම් කරන්න.

5. රසවත් ළමා කතා ප්‍රබන්ධ කළ ශ්‍රී ලාංකේය කතුවරුන් තිදෙනෙකු නම් කරන්න.

6 .පහත වචනවල අරුත් ලියන්න.

1.ළෙන්ගතුකම

2.හරිත වනපෙත

3.අනර්ඝ

4.ආයාචනය

5.කන්කලු

7. රසවත් සිදුවීමක් ඇසුරෙන් කුඩා ප්‍රබන්ධයක් ගොඩ නගන්න.

1 පාඩම - එතනහාමි

1. ඔබ දන්නා වෙනත් ජන කතා හතරක් නම් කරන්න.

2.එතනහාමි පාඩමේ සඳහන් රෝගය නම් කරන්න.

3.එම රෝගයේ විශේෂ ලක්ෂණ මොනවා ද?

4.ජනකතාවලින් අපේ භාෂාවට එකතු වූ රසවත් යෙදුම් මොනවා ද?

5.පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

- ඉත්තෑවාගේ ගෙට..................................................................................
- ගමරාළගෙ .........................................................................
- ........................................................................... හපා කනවා වගේ
- ඉබ්බා ..................................................................... නැහුණා වගේ
- බළලුන් ලවා ........................................................... බාවන්නා වගේ
- යුද්දෙට නැති ....................................................... ද?
- ..................... පිටට ..................
- අනේ ............... වනේ .....................
- පාළු ගේ ......................................................................................................... වගේ

6.වාච්‍ය අර්ථය ඉඟියෙන් ගත හැකි යෙදුම් වර්ගය කුමක් ද?

7.පහත යෙදුම්වල අදහස ලියන්න.

- තරු පෙනුණා -
- බඩට ගහනවා -
- ඇඟිලි ගනිමින් සිටියා -
- දෙහි කපනවා -
- යකා නැග්ගා -

8.පහත යෙදුම්වලට ගැළපෙන සම්ප්‍රදායික යෙදුම ලියන්න.

- දැඩි සතුටට පත්වීම -
- බොරු කීමෙන් මවා පෑම -
- බොරුවට හැඩීම -
- අවසාන උත්සහයත් දැරීම -
- එකට එක කිරීම -

9.පද දෙකක් එකතු වීමෙන් සෑදෙන සාම්ප්‍රදායික යෙදුම් විශේෂය කුමක් ද?

10. පහත හිස්තැන් පුරවන්න.

- ලට්ට ........................................
- දෙස් ..........................................
- පඩුරු .........................................
- තාඩන ........................................
- පඩි ...............................................

5 පාඩම - රාත්‍රිය

සඳ මඩල රන් තැටියකි. රෑ අහස නිල් තණ පිටියකි. පිච්ච මල් තරු කැකුළු තණ පලසේ විසුළේ ය.ඒ දසුන කෙතරම් සොඳුරු ද?

1.සමන් පිච්ච මල් ඉහිරුණු

..................................................

වගෙයි අහස ...............................

..................................

2.මගේ සුරතල් අක්කාගේ

....................................................

මේ වැටෙන්නේ ..............................

හදමු එකක් ඒ වාගේ

3. බකමූණෝ ද මාවවුලෝ ද නිශාචරයෝ ය.මුළු රෑම හැමදේ ම නිදන්නට වූ කල්හි නිශාචර පක්ෂීහු අවදි වී ඇත්තෝ ය.
කවියේ අදහසට අනුව පහත සඳහන් සතුන්ගේ ක්‍රියාකාරකම් විස්තර කරන්න.

බකමූණෝ -

මාවවුලෝ -

සෙසු කුරුල්ලෝ -

- කවියේ අදහසට අනුව , වරහන තුළින් පිළිතුරු තෝරා සම්පූර්ණ කරන්න.

1.හඳහාමි .................................................. අප දිහා එබී බලයි.

2.සිහිල් සුළඟ විඳින්නට .............................................. යා යුතු හොඳ ම වෙලාවයි.

3...................................... තරුවැල් පිරෙද්දි ............................................... සුදු මල් පිපුණා ම

................................................... දෙකක් වගෙයි.

4.කවියා සමන් පිච්ච මල් ඉහිරුණු නිල් තණ කොළ පිට්ටනියක් සේ දුටුවේ .................පැයූ

....................... යි .

5.පිනි කැට දුටු විට .........................................................යි කවියාට සිහිපත් වුයේ .එවැනි රසබර යෙදුම් කවියේ අදහස ලස්සන කරයි.

( මිදුලට , තරු, මහුල් ගෙවල්, සිනා පා , අහසේ , මුතු ඇට , පොළොවේ)

• කවියෝ කවි රසවත් කිරීමට විවිධ උපක්‍රම භාවිත කරති.

1 ............................................ රස මතු කිරීමට

- .............................. (ලඝු ගුරු අකුරු යොදන පිළිවෙළ)
- .................................. (කවි පාද එකම අකුරකින් අවසන් කිරීම)
- .................................. (එකම අකුරු හෝ ශබ්ද එක ළඟ යෙදීම)

2 ...............................................රස මතු කිරීමට

- ....................................(නිපාත පද යොදා ගනිමින් සමාන කොට කීම)
- ...................................(යමක් තවත් යමක් හා ගළපා ප්‍රකාශ කිරීම)
- ....................................(යමක් වෙනත් අයුරකින් සිදු වන බව කීම)

( උපමා , අර්ථ , අනුප්‍රාසය , රූපක ,ශබ්ද , උත්ප්‍රේක්ෂාලංකාරය , විරිත , එළිවැට )

• මේ කෙටි ප්‍රශ්නවලට පිළිතුරු ලියමු.

1.රාත්‍රිය කවි පෙළ රචනා කළේ කවුරුන් ද?

2.කවියා උපන් රට හා ප්‍රාන්තය කුමක් ද?

3.කවියා ලියූ දේශාභාමානී පද්‍ය කෘති දෙකක් හා ළමා කාව්‍ය නිර්මාණ දෙකක් නම් කරන්න.

# 11 පාඩම - සිරි ලංකා රටම අපි



1.තමා උපන් දෙශය පිළිබඳ ඇල්මක් ඇති ඕනෑම පුද්ගලයෙකුගේ හදවත කෙබඳු හැඟීම්වලින් යුක්ත ද?

2.දේශාභිමානී හැඟීම් යනු කුමක් ද?

3.'සිරි ලංකා රටම අපි' ගීතයේ පද මාලාව කවුරුන් විසින් ලියන ලද්දක් ද?

4.එය ගායනා කරන්නේ කවුරුන් ද?

5.ඔබ දන්නා දේශාභිමානී ගීත පහක් නම් කරන්න.

6.මහගම සේකරයන් විසින් රචිත නිර්මාණ වගුවක් පහත ශීර්ෂ යටතේ සකස් කරන්න.

- කාව්‍ය කෘති

- නවකතා

- ගීත නිර්මාණ

7.වෙනත් දේශාභිමානී ගීතයක පද පෙළ ලියා ඒ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

8.වැසි වසිනා ගීතය ලියා එයට ගැළපෙන චිත්‍රයක් අඳින්න.

9.ගීතයේ කියවෙන ජල මූලාශ්‍ර පහක් නම් කරන්න.

10. ගීයේ සඳහන් පරිදි රටේ මාවත ගොඩනැගෙන්නේ කවුරුන් අතින් ද?

11.රට රකිනා ජනතාව ලෙස මෙහි සඳහන් කර ඇත්තේ කවුරුන් ද?

12.දේශාභිමානී හැඟුම් ඇති කරවන කවි පෙළක් නිර්මාණය කරන්න.

13.පහත සඳහන් සංකල්ප රචකයාගේ අරමුණු ඉටුකර ගැනීමට සම්බන්ධ කර ඇති අයුරු පැහැදිලි කරන්න.

- රනබරණ
- විලවුන් සුවඳ

14.රට වෙනුවෙන් ගත සිත වෙහෙසන ජනයාගේ ගත දුහුවිලි, දහදිය හා මඩ කවියා උපමා කර ඇත්තේ මොනවාටද?

## 12 පාඩම - නිවැරදිව කියවමු



1.කියවීමේ මූලික ප්‍රභේද දෙක කුමක්ද ?

2.ඒ එකිනෙක වෙන වෙන ම හඳුන්වන්න.

3. ශ්‍රැතිගෝචර ශෛලිය යනු කුමක්ද?

4. මෙම පාඩමේ සඳහන් වන්නේ කිනම් වාර්තාවක්ද?

5 විවිධ කියවීම් ශෛලීන් 4ක් උදාහරණ සහිත ව නම් කරන්න.

6 . පහත නිර්මාණවල රචකයන් නම් කරන්න.

- **මනමේ -**
- **සද්ධර්මරත්නාවලිය -**

# 13වන පාඩම - වාක්‍ය රීති



- උක්ත පද , අනුක්ත පද ,නිපාද පද හා ක්‍රියා පද එකතු වී වාක්‍ය නිර්මාණය වේ.
- වාක්‍යයෙහි උක්ත පදයට අනුව අවසාන ක්‍රියාව හෙවත් අඛ්‍යාතය තැබීම රීතිය යි.
- උක්ත පදයේ ලිංග භේදය , වචන භේදය ,පුරුෂ භේදය හා වාචී භේදය අනුව අඛ්‍යාතය වෙනස් වේ.
- උක්තයට ගැළපෙන ආඛ්‍යාතය ලිවීම නිවැරදි වාක්‍යයක ලක්ෂණය යි.

ලිංග භේදය
ස්ත්‍රී ලිංග උක්ත පද යොදන්න.

1............................ ලස්සන නැටුමක් නටන්නී ය/ නටයි.

2............................ නැළෙව්වා ය / නළවයි.

3........................... අකුරු කියා දුන්නා ය / දෙන්නී ය.

4............................ බුලත් විට වෙළෙඳාම් කරයි /කළා ය.

5............................. රට පාලනය කළා ය / කරන්නී ය.

පුරුෂලිංග උක්ත පද යොදන්න.

1.ගොවියා කුඹුර ........................................./ .......................................

2.මොනරා පිල් විදහා ................................. / .......................................

3.පුතා අම්මාට ආචාර ................................ / .........................................

4.රජු රට එක්සේසත් ................................. / ..........................................

5.යහළුවා අසරණයන්ට පිහිට .................................. /.........................................

නපුංසක ලිංග උක්ත පද යොදන්න.

1.ගස මුල සමග ම ගැලවී බිමට ................................ / ............................................

2.රෑ වන විට අහස කළුවර .............................. / ..............................................

3.රළ පෙළ වෙරළේ .................................... / ................................................

4.දොරටුව සුළඟට විවෘත ............................. / .................................................

5.තරු කැට බිමට පතිත ............................... / ..................................................

• සචේතන නාම පද දහයක් උක්ත පද ලෙස ගෙන වාක්‍ය දහයක් තනන්න.

• වචන භේදය

ඒක වචන උක්ත පද

1.................................... පාසලට ආවේ ය.

2.................................... අත්තටු සලයි.

3 .................................... කණ්ඩායම හොඳින් මෙහෙයවයි.

4.................................... චාරිකාවක් සංවිධානය කළේ ය.

5 .................................... කතාවක් පැවැත්වුවා ය.

අප්‍රාණවාචී ඒක වචන හා බහු වචන උක්ත පද

1.නෞකා මුහුදේ යාත්‍රා ............................. / .................................

2.පන්දුව ඉතා ඉහළින් ගොස් හයේ සීමාව පසු ................................. / .................................

3.රථය වේගයෙන් ඉදිරියට ................................ / ...........................................

4.දුරකථනය නොනවත්වා ම නාද ....................... / .............................

5.තිරය ඉතා සෙමෙන් ....................................... / .....................................

## 14 වන පාඩම - කතරගම පුදබිම



කෙටි පිළිතුරු ලියමු.

1.කතරගම දෙවියන්ට ආරක්ෂාව සඳහා භාර කෙරුණේ මොනවා ද?

2.කතරගම පුරවරයට අදාළ ධාතුවංශයේ සඳහන් විස්තරය කුමක් ද?

3. කතරගම පූජා භූමියේ මහා දේවාලයට අමතරව ඇති අතිශය වැදගත් අංග මොනවා ද?

4. කතරගම දෙවියන්ට ව්‍යවහාර වන වෙනත් නම් මොනවා ද?

5. කතරගම දෙවියන්ගේ මුහුණු හයෙන් පිළිඹිබු වන ලක්ෂණ නම් කරන්න.

6. පහත ව්‍යාවහාරවල අර්ථය ලියන්න.

- ආලත්ති අම්මලා
- මණ්ඩය
- වට්ටාරම
- මුළුතැන්බැම
- කොළ පන්දලම
- තේවාකරුවන්
- නානුමුර මංගල්‍යය
- අෂ්ඨඵලරුහ බෝධිය

7.කතරගම දෙවියන්ගේ උපත පිළිබඳ ඇති ජනප්‍රවාද මොනවාද?

8.බස්නායක නිලමේතුමාට පැවරුණු වගකීම් හතරක් ලියන්න.

9.කාවඩි වර්ග 5ක් නම් කරන්න.